# ශ්‍රී ලංකාව හා චීන සබඳතා පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් : චීන මැටි බඳුන් ඇසුරින්

*රංගිකා මධුමාලි, ඒ. කේ.* [1]

ශ්‍රී ලංකාව හා චීනය ආසියානු කලාපය තුළ පිහිටා ඇති රටවල් ලෙස සැලකිය හැකි අතර වර්තමානයේ සංවර්ධන කටයුතු හා විවිධ පරමාර්ථ මූලික කරගෙන මෙම රටවල් දෙක අතර මනා සබඳතාවක් ගොඩනැගී ඇති බව හඳුනාගත හැකි වේ. දීර්ඝ කාලයක පටන් පැවත එන මෙම සබඳතාවල ඓතිහාසික තොරතුරු විමර්ශනය කිරීම සඳහා භාවිත කළ හැකි විශ්වාසදායක සාක්ෂ්‍ය වශයෙන් පුරාවිද්‍යාත්මක පර්යේෂණවලින් අනාවරණය කර ගන්නා වූ ද්‍රව්‍යාත්මක සාධක භාවිත කළ හැකි වේ. මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාව හා චීනය අතර පැවති සබඳතා පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධකයක් වන චීන මැටි බඳුන් ඇසුරින් අධ්‍යයනය කිරීමය. එහිදී ප්‍රධාන වශයෙන් සාධක හමු වූ ප්‍රදේශවල ඓතිහාසික පසුබිම පිළිබඳවත් චීන මැටි බඳුන් පිළිබඳවත් චීනය හා ශ්‍රී ලංකාව අතර පැවති සංස්කෘතික, සමාජීය, ආර්ථික, දේශපාලනික හා ආගමික සබඳතා පිළිබඳවත් අධ්‍යයනය කෙරිණ. පර්යේෂණ පත්‍රිකාවට අදාළ මූලික දත්ත සම්පාදනය කරගැනුණේ සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය හා පූර්ව පර්යේෂණ වාර්තා ආදිය පරිශීලනය කිරීමෙනි.

පුරාවස්තු යනු අතීත මානවයා හා ඔවුන් අයත් සමාජයේ පවතින සියලුම භෞතික වස්තූන්ය. පුරාවිද්‍යාත්මක අර්ථ නිරූපණ සඳහා බෙහෙවින් වැදගත් වන පුරාවස්තු, විවිධ ස්වරූපයේ දේශීය හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අධ්‍යයනය සඳහා යොදා ගන්නා ප්‍රබල සාධකයක් වේ. ශ්‍රී ලංකාවෙන් හමුවන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති සෙරමික් හෙවත් මැටියෙන් කරන ලද මෙවලම් දේශීය සම්භවයක් මෙන්ම විදේශීය සම්භවයක් ඇති ද්‍රව්‍යාත්මක සාධක වේ. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානවලින් සොයාගන්නා ලද විදේශීය මැටි බඳුන් අතර චීන මැටි බඳුන් සුවිශේෂ වේ. දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශවලිනුත් රට අභ්‍යන්තරයෙනුත් සොයා ගෙන ඇති චීන සෙරමික් මැටි බඳුන් පර්සියානු භාජනවලට වඩා තත්ත්වයෙන්, ප්‍රමිතියෙන්, ගුණාත්මක භාවයෙන් මෙන්ම ප්‍රමාණයෙන්ද විශාල වේ.

මෙලෙස ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමු වූ චීන මැටි භාජන අධ්‍යයනය කිරීමේදී ඒවායෙහි අයිතිය චීනයේ රාජ්‍යත්වය දැරූ උතුරු සුංග් රාජවංශය, දකුණු සුංග් රාජවංශය, මිංග් රාජවංශය, යුවාන් රාජවංශය, චිං රාජවංශය, තංග් රාජවංශය යන රාජ වංශ හයක කාල සීමාවකට අයත් වන බව තහවුරු වේ. මේ අනුව පුරා ශතවර්ෂ ගණනාවක පටන් චීනයේ සිට ගෙන එන ලද චීන මැටි බඳුන් මෙරට රජවරුන්ගේත්, ප්‍රභූවරුන්ගේත්, භික්ෂූන් වහන්සේලාගේත් චීනයේ සිට පැමිණි සංචාරකයින්ගෙත් පාවිච්චිය සඳහා රැගෙන ආ බව සනාථ කළ හැකිය. ශ්‍රී ලංකාවෙන් හමුවන චීන මැටි බඳුන්වල වර්ණය හා ස්වභාවය අනුව වර්ග කිහිපයකට ඒවා වෙන් කළ හැකි අතර, විවිධ අවශ්‍යතා පූරණය කරගැනීම සඳහා නිර්මාණය කරන ලද මැටි බඳුන්ද ඒවා අතර හමු වේ. පුරාවිද්‍යාත්මක පර්යේෂණවලින් බොහෝ විට හමුවන්නේ මෙම බඳුන්වල අවශේෂ කොටස් වන අතර සුරක්ෂිත සම්පූර්ණ මැටි බඳුන් හමුවන්නේ අල්ප වශයෙනි. වර්තමානය වන විට මෙම පුරාවස්තු බොහොමයක් කෞතුකාගාරවල තැන්පත් කර තිබෙනු දැකිය හැකිය.

චීනය හා ශ්‍රී ලංකාව අතර පැවති සබඳතා පැහැදිලිව ඔප්පු කිරීම සඳහාත්, ඒ සම්බන්ධව පවතින සාහිත්‍ය මූලාශ්‍රයගත තොරතුරුවල විශ්වාසනීයත්වය තවදුරටත් තහවුරු කරගැනීම සඳහාත් යොදාගත හැකි ප්‍රබල සාක්ෂියක් ලෙස මෙරටින් හමු වූ චීන සෙරමික් භාණ්ඩ පෙන්වා දිය හැකි වේ. චීන සංචාරකයින් ශ්‍රී ලංකාවට පැමිණියේ වාණිජ අරමුණින් පමණක් නොවේ; ආගමික, දේශපාලනික හා සංස්කෘතික සම්බන්ධතා ගොඩනගා ගැනීමේ අරමුණුද ඒ හා බද්ධව පැවති බව තවදුරටත් මෙම සාධකවලින් සනාථ කරගත හැකිය.

**ප්‍රමුඛ පද :** චීන සෙරමික් බඳුන්, පුරාවිද්‍යාත්මක පර්යේෂණ, ශ්‍රී ලංකාව, චීනය

[1]*Department of Archaeology, University of Kelaniya, Sri Lanka.*
*rangikathilakarathna8@gmail.com*